# සතිපතා ආර්ථික දර්ශක



## 2025 ඔක්තෝබර් 24

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

2025 සැප්තැම්බර් මාසයේ දී, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2025 අගෝස්තු මාසයේ වාර්තා වූ සියයට 1.5ට සාපේක්ෂව සියයට 2.1ක් දක්වා ඉහළ ගියේය. ආහාර සහ ආහාර නොවන උද්ධමනය, පිළිවෙළින්, සියයට 3.8ක් සහ 0.7ක් ලෙස වාර්තා විය. මේ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2025 අගෝස්තු මාසයේ වාර්තා වූ සියයට 1.5ක සිට 2025 සැප්තැම්බර් මාසයේ දී සියයට 1.9ක් දක්වා ඉහළ ගියේය.

2025 ඔක්තෝබර් 21 දින සිට ඔක්තෝබර් 24 අතර වූ කාලපරිච්ඡේදය තුළ දී, බොරතෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. එක්සත් ජනපදය සහ චීනය අතර වෙළඳ ගිවිසුමක් ඇතිවීම පිළිබඳ ශුභවාදී අපේක්ෂා හේතුවෙන් කාලපරිච්ඡේදය ආරම්භයේ දී මිල ගණන් ඉහළ ගියේය. ඉන් අනතුරුව, ගෝලීය තෙල් නිෂ්පාදනයෙන් සියයට 5කට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන රුසියාවේ විශාලතම තෙල් සමාගම් දෙකට එරෙහිව එක්සත් ජනපදය විසින් සම්බාධක පැනවීම හේතුවෙන් මිල ගණන්වල තියුණු ඉහළ යෑමක් දක්නට ලැබුණි. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල, පිළිවෙළින්, එ.ජ.ඩොලර් 4.75කින් සහ එ.ජ.ඩොලර් 4.14කින් ඉහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2025 ඔක්තෝබර් මස 24 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 24කින් සියයට 8.17ක් දක්වා ඉහළ ගියේය.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පෙර සතියේ අග පැවති සියයට 7.89ට සාපේක්ෂව 2025 ඔක්තෝබර් මස 24 දින සියයට 7.90ක් විය.

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය ඉහළ යෑම සහ වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ ගියේය.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 133.22ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 129.13ක අතිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2025 ඔක්තෝබර් මස 24 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 0.79කින් දර්ශක අගය 22,812.52ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 0.05කින් දර්ශක අගය 6,266.31ක් දක්වා ඉහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

සතිය තුළ දී, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ඵලදා අනුපාතික පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 1.6 ගුණයකට ආසන්න වේ.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 28.2ක ප්‍රතිශතයකින් පහළ යෑමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය

2025 වසරේ ඔක්තෝබර් 24 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 3.6කින් අවප්‍රමාණය විය.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක


| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2024 | 2025 | |
|---|---|---|---|
| | සැප්. | අගෝස්තු | සැප්. |
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 203.1 | 207.2 | 207.4 |
| මාසික ප්‍රතිශත වෙනස % | (0.5) | (0.5) | 0.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.7 | (1.0) | (0.9) |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | (0.2) | 1.5 | 2.1 |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 192.5 | 195.8 | 196.2 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.3 | 0.7 | 0.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 1.9 | 1.5 | 1.9 |

| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2024 | 2025 | |
|---|---|---|---|
| | සැප්. | අගෝස්තු | සැප්. |
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 190.9 | 193.3 | 193.7 |
| මාසික ප්‍රතිශත වෙනස % | (0.1) | (0.4) | 0.2 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.4 | (1.5) | (1.4) |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | (0.5) | 1.2 | 1.5 |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 177.6 | 180.9 | 181.2 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 2.8 | 1.8 | 1.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 3.3 | 2.0 | 2.0 |

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 230.00 | 240.00 | 239.60 | 240.00 | 245.00 | 250.00 | 250.00 | 250.00 |
| රතු කැකුළු | 203.00 | 198.00 | 207.40 | 208.00 | 210.00 | 215.00 | 215.00 | 215.00 |
| බෝංචි | 290.00 | 300.00 | 240.00 | 225.00 | 340.00 | 350.00 | 290.00 | 275.00 |
| ගෝවා | 106.00 | 100.00 | 70.00 | 60.00 | 156.00 | 150.00 | 118.00 | 100.00 |
| කැරට් | 92.00 | 110.00 | 108.00 | 105.00 | 142.00 | 160.00 | 158.00 | 155.00 |
| තක්කාලි | 210.00 | 127.50 | 124.00 | 117.50 | 260.00 | 175.00 | 164.00 | 165.00 |
| වට්ටක්කා | 114.00 | 40.00 | 66.00 | 67.50 | 158.00 | 100.00 | 120.00 | 110.00 |
| පතෝල | 308.00 | 187.50 | 182.00 | 165.00 | 358.00 | 237.50 | 232.00 | 215.00 |
| වම්බටු | 200.00 | 170.00 | 200.00 | 200.00 | 250.00 | 220.00 | 250.00 | 250.00 |
| අමු මිරිස් | 330.00 | 172.50 | 220.00 | 195.00 | 380.00 | 222.50 | 270.00 | 245.00 |
| දෙහි | 460.00 | 1,325.00 | 1,960.00 | 2,000.00 | 510.00 | 1,425.00 | 2,160.00 | 2,200.00 |
| රතු ළූණු ( දේශීය) | 325.60 | 267.00 | 235.60 | 255.50 | 400.00 | 350.00 | 350.00 | 350.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 213.00 | 135.50 | 149.20 | 136.00 | 250.00 | 155.00 | 166.00 | 175.00 |
| අර්තාපල් ( දේශීය) | 256.80 | 235.00 | 222.20 | 224.75 | 300.00 | 290.00 | 288.00 | 307.50 |
| වියළි මිරිස් ( ආනයනික) | 715.20 | 617.00 | 643.40 | 641.75 | 830.00 | 700.00 | 700.00 | 700.00 |
| රතු පරිප්පු | 278.00 | 245.00 | 236.40 | 235.75 | 300.00 | 270.00 | 270.00 | 270.00 |
| බිත්තර-සුදු ( ඒකක මිල) | 38.40 | 31.00 | 25.40 | 24.00 | 38.90 | 31.50 | 25.90 | 24.50 |
| පොල් ( ගෙඩියක මිල) | 130.00 | 166.25 | 170.00 | 170.00 | 164.00 | 175.00 | 175.00 | 175.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|
| | පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 230.20 | 237.00 | 243.40 | 242.00 |
| සුදු කැකුළු | 211.20 | 195.00 | 202.60 | 203.00 |
| රතු කැකුළු | 207.00 | 191.00 | 201.60 | 200.50 |
| නාඩු | 223.40 | 204.25 | 212.60 | 213.00 |

ලැ.නො. - ලැබී නොමැත.


## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 238.00 | 238.00 |
| රතු කැකුළු | 188.00 | 188.00 |
| බෝංචි | 235.00 | 228.75 |
| ගෝවා | 62.60 | 77.50 |
| කැරට් | 90.00 | 125.00 |
| තක්කාලි | 102.00 | 123.75 |
| වට්ටක්කා | 40.80 | 34.75 |
| පතෝල | 207.50 | 136.25 |
| වම්බටු | 171.00 | 156.25 |
| අළු කෙසෙල් | 72.60 | 66.25 |
| රතු ළූණු ( දේශීය) | 219.00 | 227.50 |
| රතු ළූණු ( ආනයනික) | ලැනො. | 259.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 137.50 | 137.75 |
| අර්තාපල් ( දේශීය) | 186.00 | 170.75 |
| අර්තාපල් ( ආනයනික) | 176.40 | 169.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 642.50 | 603.33 |
| පොල් ( ගෙඩියක මිල) | 155.40 | 167.00 |


## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සුදු නාඩු | 230.00 | 230.00 |
| රතු කැකුළු | 220.00 | 220.00 |
| බෝංචි | 464.00 | 440.00 |
| ගෝවා | 296.00 | 280.00 |
| කැරට් | 252.00 | 240.00 |
| තක්කාලි | 240.00 | 235.00 |
| වට්ටක්කා | 84.00 | 87.50 |
| පතෝල | 344.00 | 340.00 |
| වම්බටු | 400.00 | 405.00 |
| අමු මිරිස් | 400.00 | 450.00 |
| රතු ළූණු ( දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 160.00 | 180.00 |
| අර්තාපල් ( දේශීය) | 340.00 | 340.00 |
| අර්තාපල් ( ආනයනික) | 240.00 | 240.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 760.00 | 760.00 |
| රතු පරිප්පු | 260.00 | 260.00 |
| සුදු සීනි | 230.00 | 230.00 |
| බිත්තර- සුදු ( එකක මිල) | 29.00 | 29.00 |
| පොල් ( ගෙඩියක මිල) | 200.00 | 220.00 |


### නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල




## 1.2.5 මාළු වෙළඳපොළ


| | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 1,340.00 | 1,250.00 | 1,330.00 | 1,025.00 | 1,982.00 | 1,575.00 | 2,680.00 | 1,940.00 |
| බලයා | 670.00 | 650.00 | 790.00 | 685.00 | 996.67 | 885.00 | 964.00 | 873.33 |
| සාලයා | 182.00 | 292.50 | 196.00 | 300.00 | 324.00 | 437.50 | 312.00 | 365.00 |
| හුරුල්ලා | 640.00 | 700.00 | 664.00 | 602.50 | 850.00 | 800.00 | 888.00 | 970.00 |

ලැනො. - ලැබී නොමැත.

### 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | දෙවන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2023 (ආ)(ආ) | 2024 (ආ) | 2024(ආ)(ආ) | 2025 (ආ) |
| කෘෂිකාර්මික | 1.6 | 1.2 | 2.7 | 2.0 |
| කාර්මික | (9.2) | 11.0 | 9.7 | 5.8 |
| සේවා | (0.2) | 2.4 | 1.9 | 3.9 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | 2.6 | 10.6 | 2.6 | 13.5 |
| දළ දේශීය නිෂ්පාදිතය | (2.3) | 5.0 | 4.1 | 4.9 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | අගෝස්තු | | % වෙනස |
|---|---|---|---|
| | 2024 (අ) | 2025 (අ) | |
| තේ (කි.ග්‍රෑ. මිලියන) | 21.3 | 19.7 | (7.8) |
| රබර් (කි.ග්‍රෑ. මිලියන) | 6.0 | 6.1 | 1.9 |
| පොල් (ගෙඩි මිලියන) | 243.5 | 286.9 | 17.8 |

(අ) තාවකාලික





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

### 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | අගෝස්තු | | % වෙනස |
|---|---|---|---|
| | 2024 (ආ) | 2025 (ආ) | |
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 91.2 | 98.2 | 7.6 |
| ආහාර නිෂ්පාදන | 97.0 | 92.3 | (4.8) |
| ඇඟලුම් නිෂ්පාදන | 95.7 | 109.7 | 14.7 |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 107.4 | 118.9 | 10.7 |
| අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 17.0 | 100.1 | 488.5 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 92.4 | 80.5 | (12.9) |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 85.4 | 86.8 | 1.7 |
| පාන වර්ග | 128.4 | 128.8 | 0.3 |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


### 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2024 | | 2025 | |
|---|---|---|---|---|
| | අගෝ. | සැප්. | අගෝ. | සැප්. |
| දර්ශකය | 55.5 | 54.1 | 55.2 | 55.4 |


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2024 | | 2025 | |
|---|---|---|---|---|
| | අගෝ. | සැප්. | අගෝ. | සැප්. |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය | 65.2 | 53.4 | 68.9 | 58.7 |

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් | 2024 | | 2025 | |
|---|---|---|---|---|
| | ජූලි | අගෝ. | ජූලි | අගෝ. |
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 62.9 | 51.4 | 60.0 | 61.1 |

(අ) පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, සේවා සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ මූලික දර්ශක ලෙස පිළිවෙළින්, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය සැලකෙන අතර, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, උප-දර්ශක පහක බරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරනු ලැබේ. තවද, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය හා සැසඳිය හැකිය.







## 1.7 සේවා නියුක්තිය [(අ)]

| අයිතමය | 2024 | 2024 කාර්තු:2 | 2025 කාර්තු:2 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 47.4 | 47.8 | 49.3 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.4 | 4.7 | 3.8 |

**අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන්[(ආ)] (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)**


| | 2024 | 2025 කාර්තු:1 | 2025 කාර්තු:2 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.0 | 23.4 | 25.7 |
| කර්මාන්ත | 25.6 | 26.2 | 25.3 |
| සේවා | 48.5 | 50.3 | 49.0 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2024 අගෝ. | 2025 අගෝ. | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 161.3 | 183.4 | 13.7 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 181.3 | 191.9 | 5.8 |
| කෘෂිකර්මාන්ත | 182.7 | 193.2 | 5.8 |
| කර්මාන්ත | 179.6 | 191.6 | 6.7 |
| සේවා | 184.1 | 191.3 | 3.9 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2024 | | | 2025 | | |
|---|---|---|---|---|---|---|
| | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) |
| | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | |
| ජනවාරි | 78.93 | 73.64 | 91.48 | 77.90 | 74.77 | 76.14 |
| පෙබරවාරි | 81.48 | 76.53 | 81.33 | 75.12 | 71.37 | 76.32 |
| මාර්තු | 84.57 | 80.23 | 82.76 | 71.41 | 67.88 | 83.33 |
| අප්‍රේල් | 88.99 | 84.47 | 86.00 | 66.96 | 63.54 | 83.47 |
| මැයි | 83.28 | 78.97 | 88.49 | 63.96 | 60.86 | 75.75 |
| ජුනි | 82.58 | 78.42 | 92.88 | 70.13 | 68.14 | 70.79 |
| ජූලි | 84.14 | 80.85 | 87.57 | 69.29 | 66.94 | 66.70 |
| අගෝස්තු | 79.03 | 75.71 | - | 67.47 | 64.23 | 66.84 |
| සැප්තැම්බර් | 73.27 | 69.93 | 87.38 | 67.63 | 63.69 | 73.51 |
| ඔක්තෝබර් | 75.29 | 71.55 | 81.75 | | | |
| නොවැම්බර් | 73.51 | 69.73 | 76.72 | | | |
| දෙසැම්බර් | 73.02 | 69.57 | 77.50 | | | |

| දිනය | 2024 | | 2025 | |
|---|---|---|---|---|
| 18-10 | 74.63 | 70.89 | - | - |
| 19-10 | - | - | - | - |
| 20-10 | - | - | - | - |
| 21-10 | 73.03 | 69.26 | 60.80 | 57.22 |
| 22-10 | 74.05 | 70.27 | 61.52 | 57.46 |
| 23-10 | 75.78 | 72.09 | 64.05 | 59.88 |
| 24-10 | 75.68 | 71.54 | 65.55 | 61.36 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2025-10-20 | 2025-10-21 | 2025-10-22 | 2025-10-23 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 2,457.20 | 2,536.20 | 2,586.00 | 2,506.20 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ.) | 45.58 | 45.80 | 47.69 | 47.22 |
| ජල (ගි. වො. පැ.) | 23.57 | 24.14 | 23.12 | 24.66 |
| ගල් අඟුරු (ගි. වො. පැ.) | 12.31 | 12.09 | 11.91 | 10.28 |
| තෙල් (ගි. වො. පැ.) | 4.72 | 3.98 | 3.87 | 3.37 |
| සුළං (ගි. වො. පැ.) | 0.10 | 0.99 | 3.04 | 3.50 |
| සූර්ය (ගි. වො. පැ.) | 4.82 | 4.53 | 5.64 | 5.19 |
| ජෛව ස්කන්ධය (ගි. වො. පැ.) | 0.05 | 0.07 | 0.13 | 0.22 |





මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඇ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2023 වසරේ පෙබරවාරි, සැප්තැම්බර් සහ 2024 අගෝස්තු යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඈ) තාවකාලික

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතිකය | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) (අ) | - | 7.75 | 7.75 |
| **නිත්‍ය පහසුකම් අනුපාතික (අ)** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 8.25 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 9.25 | 8.25 | 8.25 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිය අවසානයට) | 8.57 | 7.89 | 7.90 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | |
| දින 91 | 9.32 | 7.52 | 7.52 |
| දින 182 | 9.65 | 7.89 | 7.89 |
| දින 364 | 9.95 | 8.02 | 8.02 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 9.17 | 7.93 | 8.17 |

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය




| | 2024 අගෝස්තු | 2025 ජූලි | 2025 අගෝස්තු |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 9.00 | 0.25 - 9.00 | 0.25 - 9.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 2.50 - 21.00 | 2.50 - 12.00 | 2.50 - 12.00 |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 7.87 | 6.88 | 6.82 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 9.67 | 8.46 | 8.36 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 7.07 | 6.24 | 6.11 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 7.15 | 6.90 | 6.61 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 12.12 | 11.50 | 11.44 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 11.23 | 10.40 | 10.35 |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය (AWSR) (ආ) | 12.88 | 11.78 | 11.66 |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය (AWNSR) (ආ) | 11.95 | 10.77 | 10.79 |

| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2024 අගෝස්තු | 2025 ජූලි | 2025 අගෝස්තු |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 7.75 | 6.75 | 6.75 |

| භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය | වසර 04 මාස 09<br>2025 ඔක්. 13 | වසර 08 මාස 01<br>2025 ඔක්. 13 | වසර 11 මාස 09<br>2025 ඔක්. 13 |
|---|---|---|---|
| පොලී අනුපාතිකය | 9.75 | 9.00 | 10.75 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 9.80 | 10.72 | 11.01 |


**බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව**


| | සතියකට පෙර | මෙම සතිය | | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 8.46 | 8.20 | කාර්ගිල්ස් බැංකුව (ඇ) | 8.80 | 8.80 |
| මහජන බැංකුව | 8.08 | 8.19 | එච්එස්බීසී බැංකුව | 7.35 | 8.48 |
| හැටන් නැෂනල් බැංකුව | 8.53 | 8.04 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 7.84 | 7.84 |
| කොමර්ෂල් බැංකුව | 8.52 | 8.16 | සිටි බැංකුව (ඇ) | 8.25 | 8.25 |
| සම්පත් බැංකුව | 7.61 | 7.85 | ඩොයිෂ් බැංකුව | 8.07 | 8.74 |
| සෙලාන් බැංකුව | 8.82 | 8.86 | හබීබ් බැංකුව (ඇ) | 8.02 | 8.02 |
| යූනියන් බැංකුව | 9.69 | 10.41 | ඉන්දියන් බැංකුව | 9.10 | 9.10 |
| පැන් ඒෂියා බැංකුව | 8.84 | 8.75 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව | 8.10 | 8.54 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 8.17 | 7.93 | එම්සීබී බැංකුව | 8.65 | 8.10 |
| ඩීඑෆ්සීසී බැංකුව | 9.29 | 8.83 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 8.45 | 9.05 |
| එන්ඩීබී බැංකුව | 8.10 | 8.74 | පබ්ලික් බැංකුව | 9.50 | 7.43 |
| අමානා බැංකුව (ඇ) | 8.69 | 8.69 | බැන්ක් ඔෆ් චයිනා | - | - |


(අ) 2024 නොවැම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ. පදනම් අංක ± 50 ආන්තික සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කෙරේ.
(ආ) බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය මගින් බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයට ලබා දී ඇති සියලුම රුපියල් ණය සඳහා අදාළ පොලී අනුපාතික පිළිබිඹු කරන අතර, බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය මගින් යම්කිසි මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන නව රුපියල් ණය සඳහා පොලී අනුපාතික පිළිබිඹු කරයි. මෙම පොලී අනුපාතික ද්විත්වයම ගණනය කිරීමේ දී රජයේ ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම සහ බැංකුවල පවත්නා අක්‍රීය ණය බැහැර කරයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමීක්ෂණය මත පදනම්ව බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය ගණනය කරනු ලැබේ. සම්මත නිර්වචනයට අනුකූලව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශය නිර්වචනය කිරීම සඳහා මෙම සමීක්ෂණය රුපියල් බිලියන 1 නොඉක්මවන වාර්ෂික පිරිවැටුම් නිර්ණායකයක් භාවිතා කරයි.
(ඇ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | අගෝ. 2024 | ජූලි 2025 | අගෝ. 2025(අ) | අගෝ. 2024 | ජූලි 2025 | අගෝ. 2025(අ) |
| සංචිත මුදල් | 1,485.7 | 1,688.4 | 1,712.2 | 5.6 | 16.0 | 15.2 |
| පටු මුදල් සැපයුම (M1) | 1,800.6 | 2,094.4 | 2,123.1 | 18.7 | 18.4 | 17.9 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 12,228.6 | 13,400.7 | 13,512.8 | 10.8 | 9.9 | 10.5 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 13,876.8 | 15,205.8 | 15,367.9 | 9.3 | 10.0 | 10.7 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්(ආ) | 293.3 | 878.4 | 999.4 | 148.0 | 298.8 | 240.7 |
| මුදල් අධිකාරීන් | (100.7) | 441.4 | 514.8 | 89.5 | 319.3 | 611.2 |
| වාණිජ බැංකු | 394.0 | 437.0 | 484.6 | 13.8 | 3.7 | 23.0 |
| දේශීය බැංකු ඒකක (DBUs) | (236.0) | (369.4) | (416.0) | 18.7 | (86.3) | (76.3) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 630.0 | 806.4 | 900.5 | (1.0) | 30.1 | 42.9 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම්(ආ) | 13,583.4 | 14,327.4 | 14,368.6 | 2.1 | 5.3 | 5.8 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 8,058.8 | 8,535.9 | 8,381.4 | (4.8) | 4.7 | 4.0 |
| මහ බැංකුව | 1,754.9 | 1,850.7 | 1,862.0 | (42.6) | 2.5 | 6.1 |
| වාණිජ බැංකු | 6,303.9 | 6,685.2 | 6,519.4 | 16.5 | 5.3 | 3.4 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,145.8 | 6,615.1 | 6,448.7 | 19.5 | 6.9 | 4.9 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 158.1 | 70.1 | 70.7 | (41.3) | (56.0) | (55.3) |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 651.6 | 603.6 | 617.8 | (40.6) | (10.2) | (5.2) |
| දේශීය බැංකු ඒකක (DBUs)(ඇ) | 599.3 | 550.3 | 564.4 | (42.4) | (11.1) | (5.8) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 52.3 | 53.3 | 53.3 | (8.3) | (0.1) | 2.0 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,707.7 | 9,057.6 | 9,284.4 | 8.7 | 19.6 | 20.5 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 7,128.9 | 8,449.1 | 8,688.3 | 8.3 | 20.7 | 21.9 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 578.8 | 608.5 | 596.1 | 13.4 | 6.3 | 3.0 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (2,834.7) | (3,869.7) | (3,915.1) | 15.3 | (38.6) | (38.1) |












## 2.3 සංචිත මුදල් හා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

| | 2025-10-16 | 2025-10-23 |
|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,733,509.91 | 1,746,266.04 |

| | 2025-10-17 | 2025-10-24 |
|---|---|---|
| සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (රුපියල් මිලියන) | 1,502,851 | 1,504,580 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| ඒක් ෂණ මුදල් වෙළඳපොළ | 2025-10-21 | 2025-10-22 | 2025-10-23 | 2025-10-24 |
|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 7.89 | 7.89 | 7.90 | 7.90 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 44.80 | 47.10 | 46.52 | 55.74 |

| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 2025-10-21 | 2025-10-22 | 2025-10-23 | 2025-10-24 |
|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 7.92 | 7.92 | 7.91 | 7.92 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 106.45 | 64.40 | 124.18 | 55.88 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2025-10-21 | 2025-10-22 | 2025-10-23 | 2025-10-24 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,508.9 | 2,508.9 | 2,508.9 | 2,508.9 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,574.5 | 1,574.2 | 1,574.0 | 1,573.5 |

(අ) තාවකාලික
(ආ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට (M2b) අදාළව
(ඇ) 2025 අගෝස්තු මාසයේ දී දේශීය බැංකු ඒකක තුළින් රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය ප්‍රමාණයෙහි වැඩිවීම සඳහා සමහර බැංකු විසින් වාර්තා කරන ලද දත්ත සංශෝධනයන් ප්‍රධාන වශයෙන් හේතු විය.

## 2.6 විවට වෙළඳපොළ කටයුතු

| අයිතමය | 2025-10-21 | 2025-10-22 | 2025-10-23 | 2025-10-24 |
|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| බරිත සාමාන්‍ය එළදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | - | - | - | - |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| බරිත සාමාන්‍ය එළදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| බරිත සාමාන්‍ය එළදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| පියවීමේ දිනය | - | - | - | - |
| පරිණත වන දිනය | - | - | - | - |
| කාල සීමාව (දින ගණන) | - | - | - | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | - | - | - | - |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| බරිත සාමාන්‍ය එළදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | - | - | - | - |
| **නිත්‍ය පහසුකම** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 138.17 | 135.47 | 138.91 | 138.33 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 18.06 | 16.39 | 15.60 | 9.19 |
| | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **120.11** | **119.08** | **123.31** | **129.13** |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[අ]** | **120.11** | **119.08** | **123.31** | **129.13** |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම් /ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු


### 2.7.1 ණය කාඩ්පත්[(අ)]


| | 2024 දෙසැම්බර් | 2025 ජූලි | 2025 අගෝස්තු[(ආ)] |
|---|---|---|---|
| මුළු සක්‍රිය කාඩ්පත් ගණන | 2,008,456 | 2,088,069 | 2,102,537 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 9,772 | 9,142 | 9,099 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,998,684 | 2,078,927 | 2,093,438 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 157,957 | 161,282 | 164,171 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 34,847 | 36,609 | 37,273 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 123,110 | 124,673 | 126,899 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු[(ඇ)]

| | 2024 දෙසැම්බර් | 2025 ජූලි | 2025 අගෝස්තු[(ආ)] |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) - රු. බිලියන[(ඈ)] | 3.1 | 3.2 | 3.2 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 0.9 | 2.3 | 2.3 |


(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද
(ආ) තාවකාලික
(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඈ) වසරේ මේ දක්වා එකතුව




## 2.8 කොටස් වෙළඳපොළ

| | 2024-10-24 | 2025-10-17 | 2025-10-24 |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI) | 12,473.50 | 22,633.80 | 22,812.52 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20) | 3,720.30 | 6,263.03 | 6,266.31 |
| දෛනික පිරිවැටුම (රු. මිලියන) | 4,791.99 | 11,277.70 | 6,213.35 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 4,578.40 | 8,093.78 | 8,155.60 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 159.53 | 157.36 | 127.54 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 199.36 | 1,551.57 | 101.68 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | (39.83) | (1,394.20) | 25.86 |




# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2024 ජන.- අගෝ. | 2025 (අ) ජන. - අගෝ. |
|---|---|---|
| ආදායම් සහ ප්‍රදාන | 2,565.92 | 3,301.46 |
| ආදායම | 2,557.79 | 3,294.74 |
| බදු ආදායම | 2,348.53 | 3,068.50 |
| බදු නොවන ආදායම | 209.26 | 226.24 |
| ප්‍රදාන | 8.13 | 6.72 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම් | 3,476.89 | 3,712.49 |
| පුනරාවර්තන | 3,041.57 | 3,381.31 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම් | 435.32 | 331.18 |
| ප්‍රාථමික ශේෂය | 648.76 | 1,276.54 |
| සමස්ත අයවැය ශේෂය | (910.96) | (411.03) |


රාජ්‍ය ආදායම සහ වියදම
ජනවාරි - අගෝස්තු




## 3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන)(ආ)

| ශීර්ෂය | 2024(අ)(ඇ) අවසානයට | 2025(අ)(ඇ) ජූනි අවසානයට |
|---|---|---|
| සමස්ත දේශීය ණය (ඈ) | 18,309.66 | 18,806.08 |
| එයින්; භාණ්ඩාගාර බිල්පත් | 4,061.55 | 3,920.33 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 14,079.20 | 14,944.78 |
| සමස්ත විදේශීය ණය (ඉ)(ඊ) | 10,429.04 | 10,828.70 |
| මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය | 28,738.70 | 29,634.78 |

මධ්‍යම රජයේ ණය
2025 මාර්තු අවසානයේ සිට 2025 ජූනි අවසානය දක්වා




